**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්ගේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවලදී හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් නොකළ යුතු නමුත්, මණ්ඩලයේ මුල්හල්කැලේ වතුයායේ පාරිතෝෂික ගිණුමේ රු.1,067,176 ක ආරම්භක හර ශේෂය හඳුනා නොගෙන මුළු ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයෙන් අඩු කර තිබීම නිසා මණ්ඩලයේ ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය එම වටිනාකමින් අවගණනයවී තිබුණි. | මුල්හල්කැලේ වතුයාය සම්බන්ධව පවතින ශේෂ පත්‍රයේ ගෙවියයුතු පාරිතෝෂික ශේෂය ලෙස හර අගයක් පෙන්නුම් කරන අතර මෙම ශේෂ සම්බන්ධව තොරතුරු ආයතනය සතුව නොමැත. එම නිසා එම ශේෂය 2024 වර්ෂයේදි ශේෂ පත්‍රය තුළ එම ශේෂය වෙනම පෙන්වීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 06 ඡේදය ප්‍රකාරව කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරා තිබුණු රු.11,832,543 ක්, වියදමක් ලෙස හඳුනා නොගෙන කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | වතුයායන්වල ඉතිරි වී ඇති කොම්පොස්ට් තොග මේ වනවිට භෞතිකව නොපවතින අතර එවකට පාලනාධිකාරියේ උපදෙස් මත එම තොග අදාළ වතුයායේ පරිණත නොවූ වගාව වෙත දැමීම සිදුකර ඇත. එබැවින් මෙම කොම්පෝස්ට් නිෂ්පාදිත ව්‍යාපෘතියට අදාළ පිරිවැය කෙරී ගෙන යන වැඩවලින් ඉවත් කර අදාළ වතුයායේ නොමේරූ වගාවන්ට අදාළව ප්‍රාග්ධනිත කිරිමට වතු වෙත අදාළ උපදෙස් ලබාදීමට කටයුතු කරනු ඇත. | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් ලෙස හඳුනාගත නොහැකි හා භෞතිකව නොමැති කොම්පෝස්ට් වටිනාකම ප්‍රාග්ධනික නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට තවදුරටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.597,433,175 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම්වල අවශේෂ හා ඵලදායී ජීව කාලය නැවත තක්සේරු ලබාගැනිම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව සඳහා තක්සේරු නිලධාරින් තෝරා පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇති අතර ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ. එම ක්‍රියාවලිය සිදුවීමෙන් අනතුරුව අදාළ තක්සේරු අගයන් ගිණුම් වලට ගැනිමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නැවත භාවිතා කරන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 50 වන ඡේදය ප්‍රකාරව සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගෙන ගණනය කිරීම කළ යුතු වුවද, සේවකයකුගේ වර්ෂ අවසානයේ ලබන මූලික වැටුප පමණක් පදනම් කරගෙන සේවා ප්‍රතිලාභ ගණනය කර තිබුණි. | ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පාරිතෝෂික ගණනය කිරිම පෙර සිටම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පාරිතෝෂික හිඟ ගෙවීම් සම්බන්ධව කටයුතු සිදුකරනු ලබන්නේ මෙම පනතට අනුව බවද සඳහන් කරමි. 2024.06.10 දින පැවති විගණන කළමනාකරන කමිටුවේදිද පාරිතෝෂික පනතට අනුව කටයුතු කිරිම නිවැරදි බව සඳහන් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණන ක්‍රමය සේවා ප්‍රතිලාභ ගණනය කිරීමට වඩා ඵලදායී ක්‍රමයක් වන බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 හි 34 ඡේදය ප්‍රකාරව මණ්ඩලය විසින් බදු පදනම මත ලබා දී ඇති හෙක්ටයාර 123,856.11 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර මණ්ඩලය විසින් පාලනය කරන ඉඩම් හෙක්ටයාර 18,716.16 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මණ්ඩලය සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 142,592.27 ඉඩම් අංශයට අනුව දැනට පවතින ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමේදි හෙක්ටයාර් 142,572.27 ලෙස නිවැරදි වී ඇත. තවද, නිශ්චිතව හඳුනාගෙන නොතිබූ ලෙස සඳහන් කර ඇති හෙක්ටයාර් 2872.48 ඉඩම් අංශයට අනුව මේ වනවිට 2604.75 දක්වා අඩු වී ඇත.එසේම මේ වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මිනුම් කටයුතු කරනු ඇති අතර වතු මැනුම් කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබාදී , වතුයායන් 07ක හෙක්ටයාර 4741.95ක් මැනුම් කටයුතු සිදුකර අවසන් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව බදු දේපල ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කළ යුතු අතර මණ්ඩලයේ අනෙකුත් වත්කම් දේපල පිරියත හා උපකරණ යටතේ තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 12 ඡේදය ප්‍රකාරව රු.43,860,677 ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම වාර්ෂිකව තක්සේරු නොකර ස්ථාවරව ඉදිරියට ගෙන එමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු.92,644,464 ක ජීව විද්‍යාත්මක වත්කම් විකුණා තිබුණද ඊට අදාල පිරිවැය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022, 2023, 2024 වර්ෂවල දැව තක්සේරු වාර්තා වන සම්පත් අංශය විසින් ලබාගෙන ඇත. ඒ අනුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් මගින් මගින් අනාවරණය කර ඇති පරිදි 2024 වර්ෂයේදී ගිණුම මගින් අවශ්‍ය ගැලපීම් සිදුකර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර විකිණීමේ පිරිවැය වත්කම් වලින් ඉවත් කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 54 (ඇ) ඡේදය ප්‍රකාරව රු.8,481,159 ක් වූ පරිණත වෙනත් ජීව විද්‍යාත්මක වත්කම් පැවැත්ම තහවුරු කරගෙන ක්ෂය කර ගිණුම් ගත කර නොතිබුණි. | පරිණත කරදමුංගු වගාව, පරිණත කරාබුනැටි වගාව 2015.01.01 දිනට පවතින ඉහත අගයන් ගිණුම්වල දිගින් දිගටම පවතින නමුත් ඒවා භෞතික වශයෙන් නොමැති බව වතුවලින් දැනුම් දී ඇත. ඒ පිළිබඳව තහවුරුවක් වතු අධිකාරින්ගෙන් ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව මෙම වත්කම් භෞතික පැවත්ම තහවුරු කර,ක්ෂය කිරීම් සිදුකිරීමට හෝ ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් වල පැවත්ම තහවුරු කර එම වත්කම් ක්ෂය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය අංශයේ පැවති රු.3,180,485 ක තොග ශේෂය තුළ ඇතුළත් රු.2,369,453 ක් වූ ආරම්භක තේ තොගය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භෞතිකව නොමැති වුවද, තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු. 2,369,453/ - ක් යනු 2019 වර්ෂයේ යල් පැන ගිය තේ තොගයේ වටිනාකම නොවන අතර, එය පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ශේෂයකි. පාරිභෝගික අංශය විසින් මෙම යල් පැන ගිය හා යල් පැනීමට ආසන්න තේ තොග නැවත භාවිතයට ගත හැකි තත්වයේ තොග බවට පත්කිරීම refire ක්‍රියාවලියට ලක් කිරීම සඳහා වතු වෙත ආපසු යවන අතර, එම ක්‍රියාවලියට ලක් කිරීමෙන් පසු නැවත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන අළෙවි කිරීම සිදු කරනු ලබනු බව පාරිභොගික අංශය විසින් දැණුම් දුන් නමුත් එම තොගයට අදාල මිළ මෙම ගිණුමට ගැළපීම මෙතෙක් සිදුකර නොමැති අතර, එය 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | භෞතිකව නොමැති තොග වටිනාකම හඳුනා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.32,762,427 ක් වූ නිෂ්පාදිත තේ තොගය තුල ඇතුළත් වතුයායන් 11කට අදාල ආරම්භක ශේෂය | වතුයායන් 11කට අදාළව රු. 2,761,476 ක තොග ශේෂය භෞතිකව නොමැති බව පිලිගනිමි. නමුත් මෙම ශේෂ ගිණුම් වලින් ලියාහැරිමට අවශ්‍ය උපකාරක තොරතුරු | භෞතිකව නොමැති තොග හඳුනාගෙන ගිණුම් වලින් ඉවත් |

| | | | |
|---|---|---|---|
| | රු.2,761,476 ක් වූ තේ තොග සහ තේ පැළ තොගය භෞතිකව නොමැති වුවද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි. | ඇතුලත් ලියවිලි ආයතනය සතුව නොමැති බැවින් දිගින් දිගටම ගිණුම් වල පවති. පාරිභෝගික අංශයේ යල් පැන ගිය තේ තොගයට අදාල විස්තරාත්මක තොරතුරු ලෙජර් ගිණුම් අංක 54680 – Ten යන ලෙජර් ගිණුමෙහි ඇතුලත් වී ඇත. ආරම්භක ශේෂය ඉවත් කිරීමට ප්‍රමාණවත් සාක්ෂි හෝ ලිපිලේඛන ආයතනය සතුව නොමැති බවත් ප්‍රකාශ කරනු ඇත. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ පවරාගත් ජීව විද්‍යාත්මක වත්කම් වල පිරිවැය රු.17,925,652 ක් වුවද, පිරිවැය ඉක්මවා ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ සමුච්චිත ක්ෂය වටිනාකම රු.18,520,206 ක් වූයෙන් වත්කමේ ශුද්ධ පොත් අගය රු.594,554 ක සෘණ ශේෂයක්ව පැවතුණි. | මෙම වටිනාකම් 2016ට පෙර සිටම පැවත එන අතර පිරිවැය ඉක්මවා ක්ෂය වී ඇති වටිනාකම පිළිබඳ නැවත වතාවක් සොයා බලා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | පිරිවැය ඉක්මවා වත්කම් ක්ෂය කිරීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3ක පිහිටි තේ කර්මාන්තශාලාව හා ඉඩම 2001 ජනවාරි මස 01 දින සිට වර්ෂ 30 ක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බදු දී තිබුණි. ආරම්භයේ සිට මේ දක්වා වසර 21ක කාලය තුළදී අයවිය යුතු රු.39,100,000 ක බදුකුලිය අය වී නොතිබූ අතර එම ලැබිය යුතු බදු කුලිය ගිණුම්ගත කරද නොතිබුණි. | මෙම හන්තාන වතුයායේ පිහිටි තේ කර්මාන්ත ශාලාවට අදාළ බදු කුලී සම්බන්ධ විස්තර, ලිඛිතව ගිණුම් අංශය වෙත මෙතෙක් ලැබී නොමැති අතර, මේ සම්බන්ධව අදාළ තොරතුරු ඉඩම් අංශයෙන් ලබාගෙන ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලයට අයවිය යුතු බදු කුලිය නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණු “වතු සංවර්ධන ව්‍යාපෘතිය” 2010 වර්ෂයේදී අවසන් කර තිබූ නමුත්, එම ව්‍යාපෘතියට අදාලව සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733 ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 12 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. මෙම ශේෂය ප්‍රතිපූරණය විය යුත්තේ කුමන ආයතනයෙන්ද යන්න හඳුනාගෙන නොතිබුණු අතර අයවීම අවිනිශ්චිත වුවද, ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශවල සිදු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති 2010 දී අවසන් වී ඇති අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත තිබූ මෙම ව්‍යාපෘතිය සිදුකළ ආයතනය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට මෙම ශේෂය අයවිය යුතු වුවත්, එම ආයතනයද දැනට ක්‍රියාත්මකව නොපවතින ආයතනයක් වන බැවින් මේ සම්බන්ධව තව දුරටත් කරුණු සොයා බැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදුකරමි. මීට අමරතව ආයතනය සඳහා බොල් ණය හා අඩමාණ ණය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | අය විය යුතු මුදල් අය කිරීම පිළිබඳ සොයා බැලිය යුතු අතර අයවීමට අවිනිශ්චිතාවය පිළිබඳව අඩමාණ ණය ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දැ තුළ ඇතුළත් රු.1,863,756 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි. | ශේෂය රු.1,863,756 ක ප්‍රධාන කාර්යාලයේ අවිනිශ්ෂිත ගිණුමේ ශේෂය 1996 වර්ෂයට පෙර සිට පැවැත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනිමට නොහැක. මේ සම්බන්ධව තොරතුරු සොයා ගැනීමට ආයතනය තුළ නොමැති නිසා පොත්වලින් කපා හැරිම සිදුකළ නොහැකි වී ඇත. | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ලුල්කඳුර වතුයායේ සවිකිරීම සඳහා ඉන්ධන ටැංකියක් මිලදී ගැනීමට ගණුදෙණුකරු වෙත ගෙවා තිබුණු රු.1,614,000 ක් වූ අත්තිකාරම් මුදල,අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | භෞතිකව මෙම ඉන්ධන ටැංකිය ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත මෙතෙක් ලැබී නොතිබුණද ඒ සඳහා සම්පූර්ණ පිරිවැයෙන් කොටසක් 60% ක් ගෙවීම සිදුකර ඇත. මෙම ඉන්ධන ටැංකිය දැනට භෞතිකව ලැබී නොමැති බැවින් කෙරීගෙන යන වැඩක් ලෙස සඳහන් කර ඇති අතර, එම ටැංකිය වැඩ නිමවී ලැබුණු පසු අදාළ වත්කම් ගිණුමට ගිණුම් ගත කිරිමට කටයුතු කරනු ඇත. | වත්කම් මිලදී ගැනීමක් ලෙස ප්‍රසම්පාදනයන් සිදු කර තිබූ බැවින් ලබා දී ඇති මුදල් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | රහතුන්ගොඩ වතුයායේ ඉදිකළ සංචාරක නිකේතනය (Eco Tea Garden) ඉදි කිරීමට වැය වූ පිරිවැය රු.2,775,742 ක් වුවද, කෙරීගෙන යන වැඩ ගිණුමෙන් රු.3,644,726 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් රු.868,984 කින් වත්කම අධිගණනය වී තිබුණි. | රහතුන්ගොඩ Eco Tea Garden වත්කම ගිණුම තුළම ආදායම් හා වියදම් ගැලපීම 2022 වර්ෂයේදි සිදුකර ඇත. ඒ අනුව රු. 868,984 ක් ලෙස එම ගිණුමේ ශේෂය සටහන් වී ඇත. එම වත්කම් ගිණුමෙන් 2022 වර්ෂයේ ආදායම් වියදම ගැලපීම ඉවත් කර එම වත්කම් ගිණුම 2025 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | වත්කම් ගිණුම් හා ආදායම් වියදම් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | හලාවත වැවිලි සමාගම 2019 වර්ෂයේ සිට මණ්ඩලය සතු ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ වර්ග අඩි 1,240.5 ක බිම් ප්‍රමාණයකට කාර්යාලයක් සහ අලෙවි සැළක් කිසිදු ගෙවීමකින් හා ගිවිසුමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි. 2019 සිට 2022 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු.8,537,096 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතු යැයි හඳුනාගෙන තිබූ අතර එම මුදල ගිණුම්ගත කිරීමට හෝ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 වසරේ සිට හලාවත වැවිලි සමාගම විසින් පරිහරණය කරනු ලබන ජනතා වතු සංවර්ධන මණ්ඩල ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ලේ වර්ග අඩි 1,240.5 ක ගොඩනැඟිලි කොටස සඳහා බදු මුදල් අය කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති අතර, ඒ අනුව ඔවුන් වෙත ගෙවීමට ඇති ණය සහ පොලී මුදල මත හිලව් කිරීමට කටයුතු කරනු ඇත.. එම සමාගම මෙම ගොඩනැඟිලි පරිශ්‍රයට පැමිණීමත් සමඟ බදු ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කළද එය ඉටු කර ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් රජයේ තක්සේරුව අනුව බදු මුදල් අය කර ගැනීම සඳහා මේ වන විට පියවර ගෙන ඇත. | විධිමත්ව ගිවිසුම්ගත වීමකින් හා තක්සේරුවක් මගින් මණ්ඩලයට ලැබිය යුතු මුදල් අය කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | හන්තාන වතුයායේ තේ අලෙවිසැළ ඉදි කිරීමේ පිරිවැය තුළ ඇතුළත් මුරකරු වෙනුවෙන් ගෙවා තිබුණු රු.1,582,601 ක වැටුප අයභාර වියදම් | හන්තාන වතුයාය විසින් වැරදි ලෙස වත්කම් ගිණුමට භර කර ඇති අතර මෙය 2025 වර්ෂයේ සිට නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | වත්කම් හා වියදම් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගිණුම්ගත නොකර වත්කම් ගිණුමේ සටහන් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් අධිගණනය වී තිබුණි. | | |
| (ඔ) | මොන්තක්‍රිස්තෝ වතුයාය 2003 වර්ෂයේ සිට විවිධ පාර්ශව වෙත බදු දී තිබූ අතර මෙම වතුයාය සතුව ඇති රු.32,168,955 ක් වූ දේපල පිරියත හා උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය බදු දුන් දේපල යටතේ වසර ගණනාවක සිට ඉදිරියට ගෙන යන අතර එම වත්කම්වල පැවැත්ම තහවුරු කර, අදාල ගැලපීම් කිරීමත්, එම වත්කම් වලට අදාල ක්ෂය ගණනය කර ගිණුම්ගත කිරීමත් මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි. | මෙම මොන්තක්‍රිස්ටෝ වතුයායේ වත්කම්වලට අදාළව ලිපි ලේඛන නොමැති බැවින් මෙම වත්කම් ක්ෂය කිරීම සිදුකර නොමැති අතර, තවදුරටත් මෙහි පැවැත්ම පිළිබඳ තහවුරු කරගැනිමටද අපහසු වී ඇත. | වත්කම්වල පැවත්ම තහවුරු කර ක්ෂය කිරීම් සිදු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය | 119,318,496 | 97,709,342 | 21,609,154 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් වතු සංවර්ධන මණ්ඩලය වෙත ලැබිය යුතු ණය ශේෂය රු.119,318,496 ක් විශ්ලේෂණය කර සාරාංශ කර වාර්තාවක් අප විසින් රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතද, රජයේ විගණනය වෙත හා අමාත්‍යාංශ විගණනය වෙත ලබාදී ඇති අතර, අප විසින් යවන ලද වාර්තාවට පිළිතුරු වශයෙන් ඔවුන්ගේ ගිණුම් වලට අනුව වතු සංවර්ධන මණ්ඩලයට අයත් ලෙජර් ගිණුම් වල පිටපත් පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අපවෙත ඒවා ඇති අතර, ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් එම ගිණුම් සතෙක්ෂණය කිරීම අපහසු වී ඇත. කෙසේ වෙතත් ජනතා වතු | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

සංවර්ධන මණ්ඩලයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් ලැබිය යුතු ණය ශේෂය රු.119,318,496 කි.

### 1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩව අලාභ ලැබීම මත 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.1,224,346,735ක් හා රු.2,325,555,749ක ඍණ අගයන් ගෙන තිබුණු අතර එදිනට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් රු.2,276,278,024ක් වී තිබුණි.මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන්ද සිදුකර නොතිබුණු අතර පියවිය යුතු බැංකු ණය ශේෂය රු.195,969,195ක් වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 25 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය.

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ දේපල පිරියත හා උපකරණ ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, ගොඩනැගිලි සහ වතුයායන්ගේ ගොඩනැඟිලි, ඕනුගල්ඔය වතුයායට අදාල ස්ථාවර වත්කම් ශේෂය සහ වෙනත් ශේෂයන්, ජල සම්පාදන ව්‍යාපෘතියෙහි ශේෂය සහ නාගස්තැන්න හා ගලබොඩ වතුයායේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ඇතුළත් පැරණි ශේෂයන් | 1,535,427,939 | සැදහුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉඩම්වල පිඹුරුපත්, සැලසුම්, තක්සේරු වාර්තා, පැවරීමට අදාල ගැසට් පත්‍ර, වාර්ෂික භෞතික සත්‍යාපන වාර්තා. | ප්‍රධාන කාර්යාලයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස සඳහන් කර ඇති ප්‍රධාන කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි රු.1,503,744,550 හි ඇතුලත් රු.1,489,375,963 පිළිබඳ විස්තරාත්මක තොරතුරු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග ලබා දී ඇත. අනිකුත් දේපළ සහ ගොඩනැගිලි වලට අදාළ විස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇත. | ඉඩම්,ගොඩනැගිලිසහ අනෙකුත් දේපල වල පැවැත්ම භෞතිකව පරීක්ෂා කර වත්කම්,ශේෂයේ නිවැරදිතාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජීව විද්‍යාත්මක වත්කම් තුළ ඇතුළත් 2015 වර්ෂයට පෙර සිට පවතින නොමේරු වෙනත් වගාවන් සහ 1996 | 14,501,969 | භෞතික සත්‍යාපන වාර්තා, ගස් සංගණන වාර්තා සහ වටිනාකම | මෙම අගයන් 1996 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරියට ගෙනයමින් පවතින අතර ඒ ඒ කාල පරිච්ඡේද වලට අවශ්‍ය තොරතුරු සොයා බලා ශේෂ නිවැරදි | භෞතික පරීක්ෂාවක් සිදුකර නිවැරදි ශේෂ තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂයට පෙර සිට පවතින පරිණත වෙනත් වගා ශේෂය | | තක්සේරු කිරීමට අදාල වාර්තා | කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | වෙළඳ ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් කල්බදු වත්කමට එරෙහිව තැන්පතු, වෙනත් තැන්පතු සහ වෙනත් ණයහිමි ශේෂය | 379,809,047 | ශේෂ සනාථන,තැන් පතුවලට අදාල ලදු පත් හා කාල විශ්ලේෂණ | මෙම ශේෂයන්හි රු.49,603,011 ක ශේෂය 2015 වර්ෂයට පෙර සිට පවතින ශේෂ වන අතර, දැනට ආයතනය තුළ මෙම ශේෂ වලට අදාළ තොරතුරු සොයා ගැනීමට හැකියාවක් නොමැති වී ඇත. ගෙවිය යුතු ශේෂය තුල ඇතුලත් වෙනත් තැන්පතු ශේෂය වන රු. 193,755,519 තුලින් බදුකරුවන්ගෙන් ඉදිරියට ලද අත්තිකාරම් ශේෂය වන අතර වෙනත් ණය හිමි ශේෂය 120,258,519 ද ඇතුළුව ශේෂ සනාථ කර නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ශේෂ සනාථනයන් මගින් නිවැරදි ශේෂ තහවුරු කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නිෂ්පාදිත තේ තොගය, පාරිභෝගික අංශයේ පැරණි ණය ගැති ශේෂය,ලැබිය යුතු රඳවාගත් බදු සහ එකතු කළ අගය මත බදු | 108,971,479 | තොග අගය කිරීමේ වාර්තා, ශේෂ සනාථන,ණය ගැති කාල විශ්ලේෂණ සහ අදාල මූලාශ්‍ර ලියවිලි | 2022 තොග සමීක්ෂණ වාර්තා 2024.11.01 දින විගණනය වෙත භාරදී ඇති අතර පාරිභෝගික අංශයේ පැරණි ණය ගැති ශේෂය රු.4,441,537 ක ආරම්භක ශේෂය වන අතර තොරතුරු ආයතනය සතුව නොපවතී.එමෙන්ම ලැබිය යුතු රඳවාගත් බදු සහ එකතු කළ අගය මත බදු රු. 13,512,887 ක අතරින් රු.9,694,535 රඳවා ගැනීමේ බදු අයකර ගැනීම සිදුකළ හැක්කේ ආයතනික සමාගම් ආදායම් බදු ගෙවන අවස්ථාවේ (CIT) වන නමුත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය මෙතෙක් අලාභ ලබන ආයතනයක්ව පැවති බැවින් ආයතනික බදු ගෙවා නොමැති අතර එමනිසා මෙම රඳවා ගැනීමේ බදු අයකර ගත නොහැකි වී ඇත. | තොග වටිනාකම් නිවැරදිව ගණනය කර ශේෂ තහවුරු කළ යුතු අතර ලේඛන වල නොමැති ශේෂයන් නිවැරදිව ගිණුම් වලින් ගැළපීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | මහජන බැංකුව වෙතින් ලබා ගත් ණය මුදල, ගෙවිය යුතු බදු වගකීම් (VAT,NBT,ESC), ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන, වෙනස් නොවන පැරණි පොදු සංචිත ශේෂය, වැව්ලි සංවර්ධන ව්‍යාපෘති ශේෂය සහ මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය | 596,513,479 | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා ණය ගිවිසුම්, ණය ගෙවීම් විස්තර සහ ශේෂ සනාථන,දේශීය ආදායම් දෙපාර්තමේන් තුවෙන් ලද සහන කාලසීමාවන්, අරමුදල් ලද මූලාශ්‍රය සහ එය ගිණුම් ගත කිරීමට අදාල ප්‍රතිපත්තිය, කළ වැඩ වාර්තා හා සහතික කළ බිල්පත්, කාල විශ්ලේෂණ හා වවුචර්පත් | මහජන බැංකුව වෙතින් ලබාගෙන ඇති ණය මුදල ඉතා පැරණි ශේෂයක් වන අතර මේ සම්බන්ධ තොරතුරු ආයතනය සතුව නොමැත.ගෙවිය යුතු බදු වගකීමට අදාළ ශේෂය පෙර වර්ෂ වල සිට පැවත වන ශේෂ වන අතර එවකට පැවැති මූල්‍ය දුෂ්කරතා නිසා ගෙවීම සිදුකිරිමට නොහැකි වී ඇත.වෙනස් නොවන පැරණි පොදු සංචිත ශේෂ වල ඇතුළත් රු.224,486,712 ක හා රු.55,280,753 ක හා රු.16,028,738 ක ශේෂයන් 2016 සිට නොවෙනස්ව පවතින ශේෂයන් වේ. මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය රු.36,310,518 මහවැලි ව්‍යාපෘතියෙන් යටවූ ගෙවල් හා ඉඩම් නැවත ප්‍රතිසංස්කරණය කිරිම සඳහා මෙම මුදල් මහවැලි සංවර්ධන මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇති අතර ආයතනය විසින් එම මුදල් එම කාර්යය සඳහා යොදවා ගෙන නොමැත. | ලේඛනගත සාක්ෂි මගින් ශේෂ සනාත කර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ තුළ ඇතුළත් මොන්ත ක්‍රිස්ටෝ වතුයායේ වත්කම් හා වගකීම්වලට අදාල පාලන ගිණුමේ ශේෂය | 40,503,226 | වත්කම් හා වගකීම් ශේෂයන්ගේ පැවැත්ම සනාථ කිරීමට අවශ්‍ය විස්තරාත්මක තොරතුරු | මෙම ගිණුමෙහි ඇතුලත් වත්කම් හා වගකීම් සම්බන්ධව තොරතුරු නොමැති බැවින් මෙම ගිණුම සතෙක්ෂණය කිරීම අපහසු වී ඇත. | වත්කම් හා වගකීම් භෞතිකව හඳුනාගෙන ශේෂ තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ වතුයායන්ට අදාලව ඉදිරිපත්වූ ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව රු.100,315,563 ක වෙළඳ හා වෙනත් ණයගැති ශේෂය තුළ වසර 5කට වැඩි ණයගැති ශේෂය රු.59,908,107 ක් පැවති අතර මණ්ඩලය විසින් මෙම ශේෂය අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වතුයායන්ට අදාළ මෙම රු.100,315,563 ක වෙළද හා වෙනත් ණයගැති කාල විශ්ලේෂණ වාර්තා අනුව වසර 4කට වැඩි ණයගැති ශේෂය රු.59,908,107 ශේෂය සත්‍ය වශයෙන් ලැබිමට ඇති ශේෂයද යන්න තහවුරුව අදාළ වතුයායෙන් ලබාගෙන ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | වතුයායන් වල වසර ගණනාවක සිට පැවත එන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව රු.402,730,972 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂයෙන් වසර 3-6 ත් අතර ලැබිය යුතු ශේෂය රු.44,307,866 ක්, වසර 6 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.53,147,964 ක් හා පාරිභෝජ්‍ය අංශයේ වසර 03 ඉක්මවූ රු.16,461,219 ක් ද සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම්වල දෝෂ, බදු ගැණුම්කරු වෙත මෙන්ම ගිණුම් අංශය වෙත ක්‍රමානුකූලව මාසිකව වාර්ෂික ඉන්වොයිස් පත් ඉඩම් අංශයෙන් නිකුත් නොකිරිම වැනි දෝෂ නිසා ගිණුම් ශේෂ නිවැරදි නොවන අතර එම ශේෂ දැනට නිවැරදි කරමින් පවතිනු ඇත. | වසර ගණනාවක සිට පවතින හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ වෙළඳ ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් රු.133,090,331 ක් වූ වෙනත් ගෙවිය යුතු ණය ශේෂය වසර ගණනාවක් තිස්සේ පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවිය යුතු ශේෂ 2015 වර්ෂයට පෙර සිට පවතින ශේෂ වන අතර, SRMC ආයතනය දැනට ක්‍රියාත්මක නොවන ආයතනයකි. | වසර ගණනාවක් තිස්සේ පවතින ශේෂ නිරවුල් කිරීමට හෝ නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කර කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වතුයායන්ගේ ණයහිමි කාල විශ්ලේෂණයට අනුව රු.102,707,782 ක් වූ ණයහිමි ශේෂයෙහි, වසර 03-05ත් අතර රු.7,289,247 ක් සහ වසර 05 ඉක්මවූ රු.75,078,035 ක ණයහිමි ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | වතුයායන්හි ණයහිමි ශේෂය තුළ ඇතුලත් වසර 3 – 5 කාලයට අයත් රු. 7,289,247 ක හා වසර 05 ඉක්මවූ රු. 75,078,035 ක ණයහිමි ශේෂ සත්‍ය වශයෙන්ම පවතිද යන්න සොයා බලා අවශ්‍ය නිවැරදි කිරිම සිදුකිරිම හා ආයතනයේ මූල්‍ය තත්වය අනුව ගෙවීම් කිරිමට කටයුතු කරනු ඇත. | ණයහිමියන්ට අදාල ගනුදෙනු තහවුරු කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට අයත් රු.154,246,177 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ වසර 6ක් ඉක්මවූ රු.128,696,631 ක ණයහිමි ශේෂයක්ද, වසර 3-6 අතර රු.2,319,990 ක ණයහිමි ශේෂයක්ද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | ආයතනයේ පවතින දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිගය නිසා මෙම ණයහිමියන් වෙත මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති අතර, මුදල් පවතින ආකාරයට වර්තමානය වනවිට මෙම ශේෂය ගෙවාගෙන යාමට කටයුතු කරනු ඇත. | ණයහිමියන්ට අදාල ගනුදෙනු හඳුනාගෙන ක්‍රමානුකූළව ගෙවීම් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ 5 (1) උප වගන්තිය | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.708,580,586 ක ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයක් සහ රු. 206,283,256 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක් ද පැවතුණි. | දිගින් දිගටම ආයතනයේ පවතින කාරක ප්‍රාග්ධන මූල්‍ය දුෂ්කරතා නිසා ආයතනයේ සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීම සිදු කිරිමට නොහැකි වී තිබු අතර, වර්තමානය වන විට නඩු දැමු සේවකයන්ට 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව මාසිකව ලද රු. මිලියන 30ක මුදලින් හා වර්තමානයේ පවතින මුදල් ප්‍රවාහයෙන් සේවයෙන් ඉවත්ව ගිය හා යන අනුපිළිවෙලට පාරිතෝෂික මුදල් ගෙවීම් සිදුකරමින් පවති. නමුත් මෙම 2023 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව මුදල් ලැබීම 2025 ජුනි මස සිට නවතා ඇත. | පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික නියමිත කාලයේදී ගෙවීමට කටයුතු කිරිම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 1998 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය | 2001 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.1,076,169,148 ක ගෙවිය යුතු අර්ථසාධක මුදලක්ද, 2008 වර්ෂයේ සිට වතු කාර්ය මණ්ඩල අර්ථසාධක සංගමයට (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට (CPPS) රු.159,197,542 ක හිඟ අර්ථසාධක ශේෂයක්ද පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය | ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETF දිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබු අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. | පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතු අතර දීර්ඝකාළීනව ගෙවීමට තිබූ මුදල් පියවීමට හා වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.29,465,691 ක ගෙවිය යුතු අධිභාර ද ගෙවා නොතිබුණි. | මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම්සදහා ලබා දෙමින් පැවැති අතර එමගින් හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යන ලදී නමුත් මෙම 2023 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව මුදල් ලැබීම 2025 ජූනි මස සිට නවතා ඇත.තවද 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජූලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකූලව ගෙවා ගෙන යමින් පවති. | |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය | 2007 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.78,168,238 ක දායක මුදල් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.3,567,176 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක්ද විය. | ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETFදිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබූ අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සදහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම්සදහා ලබා දෙමින් පැවැති අතර එමගින් හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යන ලදී නමුත් මෙම 2023 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව මුදල් ලැබීම 2025 ජූනි මස සිට නවතා ඇත.තවද 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජූලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් | පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතු අතර දීර්ඝකාළීනව ගෙවීමට තිබූ මුදල් පියවීමට හා වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රමානුකූලව ගෙවා ගෙන යමින් පවති. | |
| (ඇ) | 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත | පනතට පටහැනිව මණ්ඩලයේ හා වතුයායන් වල ආදායමෙන් සියයට 0.25 ක් "සභාපති සුභසාධක අරමුදල" නමින් අරමුදලක් 2020 වර්ෂයේදී පිහිටුවා තිබුණි. මෙම අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.2,782,654 ක් බැර කර තිබූ අතර මෙම අරමුදලින් සේවක ඇහයීම්, විවිධ පරිත්‍යාග සහ පාපැදි ණය වාරික ගෙවීම් සඳහා රු.3,323,870 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. මෙම අරමුදල ගොඩනැගීම සඳහා භාණ්ඩාගාර අනුමැතියක් හෝ ලබාගෙන නොතිබුණි. | 2022 වර්ෂයේදි මෙම අරමුදල ජනතේ ආදායමින් 0.25ක් වන රු. 1,058,243.60 ක මුදල පමණක් බැර කර ඇත. මෙම බැර කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදුකර ඇත. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය තුළ රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය නියෝග පවතින බැවින් අදාළ අනුමැතිය ලබා ඇති බව සඳහන් කරමි. ඒ අනුව විධිමත් අනුමැතියකින් තොරව මෙම අරමුදල පිහිට වු බව සඳහන් කළ නොහැකි බවත් ප්‍රකාශ කරනු ඇත. | අරමුදල පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මෙන්ම භාණ්ඩාගාරයේ අනුමැතියද ලබා ගත යුතුය. |
| (ඉ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය | 2022/2023 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තාව 2025 ජුලි 22 දින තෙක්ම ඉදිරිපත් කර නොතිබුණු අතර කාලච්ඡේදයට අදාල ආදායම් බදු ගෙවීමක්ද සිදුකර නොතිබුණි. | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම ප්‍රමාද වීම හේතුවෙන් ආදායම් වාර්තා ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීම ප්‍රමාද වී ඇත. ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම අවශ්‍ය විම මීට හේතු වී ඇත. | පනත ප්‍රකාරව තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර බදු ගෙවීම සිදු කළ යුතුය. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ වතුයායන් සතුව පවතින දේපල පිරියත හා උපකරණ ශේෂය සම්බන්ධයෙන් වත්කමේ වර්ගය, මිලදී ගත් වටිනාකම,දිනය,වාහන අපහරණය කිරීම්, වාර්ෂිකව සිදු කළ මිලදී ගැනීම්,ඉවත් කිරීම්,මාරුකිරීම් සහ එක් එක් වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි අදාල තොරතුරු ඇතුළත් කර විධිමත්ව සකස් කළ ස්ථාවර වත්කම් ලේඛණයක් මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගිණුම් අවශ්‍යතාවයන් සඳහා ආයතන විසින් වතු සඳහා හා ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනම ස්ථාවර වත්කම් සම්බන්ධ විස්තර පිළිවෙලින් 1996 වර්ෂය හා 2008 වර්ෂයන් සිට ලේඛනයක් පවත්වාගන යන අතර, විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාම සිදුකර නොමැත. ඉදිරියේදි නිවැරදි ආකාරයට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | චක්‍රලේඛණය ප්‍රකාරව අදාල තොරතුරු ඇතුලත් කරමින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,000,509 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.459,399,025 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 479,399,534 කින් සමස්ථ අලාභයේ අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අලාභයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් මණ්ඩලයේ තේ, රබර් සහ අනෙකුත් භෝග වගාවන්ට අදාල විකුණුම් ආදායම් රු.191,947,476 කින් වැඩිවීමත් ඊට අදාල විකුණුම් පිරිවැය සමස්තයක් ලෙස රු.382,952,881 කින් අඩුවීමත් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී සියයට 33කින් වැඩි වී ඇති අතර, රබර් වගාවෙන් ලද ආදායම් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී සියයට 9ක් වැඩි වී තිබුණි. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ තේ දළු හා පාරිභෝජ්‍ය අංශයේ තේ නිෂ්පාදනයට අදාල පිරිවැය පිළිවෙලින් සියයට 23කින් අඩුවීමත් හා සියයට 20කින් වැඩිවීමත් සිදුවී තිබුණි.එමෙන්ම රබර් වගාවට අදාල පිරිවැය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී සියයට 6කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේ දී ජංගම අනුපාතය 0.34:1 ක් හා 0.32:1ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ක්ෂණික වත්කම් අනුපාතය 0.30:1 ක් හා 0.29:1ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 2.8ක් වූ අතර, පසුගිය වර්ෂයේ දී දළ අලාභ අනුපාතය සියයට 44ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ ලාභ අනුපාතය සියයට 1.4ක් වූ අතර, පසුගිය වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 38ක් විය.

මණ්ඩලයේ 2021 හා 2022 වර්ෂයන්හි ඉහත සඳහන් අනුපාත පරීක්ෂාවේදී පවතින ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් හා ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය ඉක්මවූ ණය ප්‍රාග්ධනයක් පැවතීමත් තුළින් ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හා අඛණ්ඩ පැවැත්මේ අවධානම පිළිබඳ විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් වල ගිණුම්මය ක්‍රියාකාරකම් 7ක් ඉටුකර ගැනීමට අදාල මෘදුකාංග පද්ධතියක් සඳහා පෞද්ගලික සමාගමකට 2021 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දක්වා මෘදුකාංග පිහිටුවීමේ | මේ සම්බන්ධව ගිණුම් අංශය විසින් පාලන අධිකාරිය නිරන්තරයෙන් දැනුවත් කිරීම සිදුකරනු ඇත. | ඉටු නොකරන ලද ගිණුම්මය ක්‍රියාකාරකම් වෙනුවෙන් ගෙවූ මුදල් නැවත අය කර ගත යුතු අතර පද්ධතියේ පවතින |

| | | | |
|---|---|---|---|
| | සහ මාසික ගෙවීම් වෙනුවෙන් රු.13,989,750 ක් ගිවිසුම් ප්‍රකාරව ගෙවා තිබුණද, මෘදුකාංග පද්ධතිය මඟින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම,තොග පාලනය,ආදායම් හා වියදම් පාලනය යනාදි අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | | දුර්වලතාවය මත නව පද්ධතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා 2017 වර්ෂයේ වතු 17ක් වෙනුවෙන් Sage මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා දරා තිබුණු රු.826,387ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පද්ධතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම වියදම අනාර්ථික බවට පත් වී තිබුණි. | වතුයායන් මෙම Sage මෘදුකාංග දැනට භාවිතා කිරිම සිදුනොකරයි. ඒ වෙනුවෙන් දරා ඇති මෙම වියදම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ගෙන කපා හැරිමට කටයුතු කරනු ඇත. | වියදම් දැරීමට ප්‍රථම සැලසුම් සකස්කර ඵලදායී කාර්යයට පමණක් මුදල් වියදම් කළ යුතුය. |
| (ඇ) | හන්තාන වතුයායේ 2019 වර්ෂයේ ඉදිකර තිබුණු දැනට ක්රියාත්මක තත්වයේ නොමැති තේ අලෙවිසැල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,208,115ක පිරිවැයක් දරා තිබුණද එය වර්ෂ 06ක කාලයක සිට වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්ය වී පැවතුණි. | 2019 වර්ෂයේ සිට 2023.09.14 දින දක්වා මෙම තේ අලෙවිසැල හන්තාන වතු යාය මගින් පවත්වාගෙන ගොස් ඇති අතර 2023.09.15 දින එය බදු දීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් බදු කරුවකු සමග ගිවිසුම් ගත වුවද,එම බදුකරු එම තේ අලෙවිසැල භාර නොගැනීම හේතුවෙන් එම බදු ගිවිසුමට අදාලව මුදල් ආයතනය වෙත ලැබී නොමැත.2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තේ අලෙවිසැල පවත්වා ගැනීමෙන් ලද ආදායම ලෙස රු.100,000 මුදලක් පමණක් 2022 වර්ෂයේදී හන්තාන වතුයාය ගිණුම් ගත කර ඇත.මෙම තේ අලෙවි සැල සම්බන්ධ තොරතුරු වතුයාය මගින් දිගින් දිගටම විමසුවත් ඒ සඳහා වතුයාය මගින් නිසි පිළිතුරු ලබා දීමට අපොහොසත් වී ඇත. | නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යයට යොදාගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික පනත අනුව මණ්ඩලය පිහිටුවීමේ අරමුණු අනුව කෘෂිකාර්මික, නිෂ්පාදන, වතු කළමණාකරණය, ව්‍යාපාරික, මූල්‍ය හා මෙහෙයුම් යන ශේෂයන්ට අදාලව ස්ථාපිත කළ අරමුණු හා කාර්යයන් ඵලදායීව ඉටුකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද මණ්ඩලයේ අරමුණු අනුව මණ්ඩලයට පැවරුණු කෘෂිකාර්මික හා වතු ඉඩම් වල ඵලදායීත්වය උපරිම ලෙස ඉහල නැංවීමට විධිමත් සැලසුම් | විගණනය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සමඟ එකඟ වී ඇත. | පනත ප්‍රකාරව මණ්ඩලයේ අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ප්‍රකාරව මණ්ඩලයේ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සකස් කර කටයුතු කර නොතිබුණු අතර තේ හා රබර් වතුයායන් විධිමත් කළමණාකරණයක් සහිතව ලාභදායීව පවත්වාගෙන යෑමටද කටයුතු කර නොතිබුණි. තවද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 2.4 මගින් මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණද 2025 ජුලි 22 දින දක්වාම එබඳු ප්‍රතිසංවිධානයක් සිදු කර නොතිබුණි. | | |
| (ආ) | හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3ක පිහිටි තේ කර්මාන්තශාලාව හා ඉඩම 2001 ජනවාරි මස 01 දින සිට වර්ෂ 30 ක් දක්වා තේ මණ්ඩලයට බදු දී තිබුණි. මණ්ඩලය විසින් මූල්‍ය දුෂ්කරතා සඳහා 2003 වර්ෂයේදී රු.25,000,000 ක් හා 2020 වර්ෂයේදී රු.10,000,000 ක මුදලක් තාවකාලික ණය මුදල් ලෙස තේ මණ්ඩලයෙන් ලබා ගෙන තිබුණු අතර මෙම ණය මුදලින් රු.1,000,000 ක මුදලක් තේ මණ්ඩලය වෙත නැවත ගෙවීමද සිදු කර තිබුණි.මෙම ණය මුදල පියවීමට මණ්ඩලයට හැකියාවක් නොමැති නිසා හන්තාන තේ කර්මාන්තශාලාව සහ ඉඩම තේ මණ්ඩලයට පවරා දීමට මණ්ඩලයේ 2020 පෙබරවාරි 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණය අනුව එකඟ වී තිබුණද, දේපල පැවරීමේ කටයුතු හෝ බදු ගිවිසුම් ප්‍රකාරව තේ මණ්ඩලයෙන් හිඟ බදු මුදල් අයකර ගැනීමේ කටයුතු 2025 ජුලි 22 දින වන විටත් සිදු කර නොතිබුණි. තවද 2025 ජුලි 04 දින කර්මාන්තශාලවේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී පුද්ගලික ආයතනයක් විසින් එම කර්මාන්තශාලාව තේ කෞතුකාගාරයක් වශයෙන් පවත්වාගෙන යන අතර මණ්ඩලයට හෝ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. | මෙම හන්තාන වතුයායේ පිහිටි තේ කර්මාන්ත ශාලාවට අදාළ බදු කුලී සම්බන්ධ විස්තර, ලිඛිතව ගිණුම් අංශය වෙත මෙතෙක් ලැබී නොමැති අතර, මේ සම්බන්ධව අදාළ තොරතුරු ඉඩම් අංශයෙන් ලබාගෙන ඉදිරියේදි ගිණුම් ගත කිරිමට කටයුතු කරනු ඇත. | ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට ලැබිය යුතු මුදල් අය කර ගැනීමට සහ මණ්ඩලයට අයත් කර්මාන්තශාලව පුද්ගලික අංශයට මණ්ඩලයේ අවසරයකින් තොරව ලබා දීම පිළිබඳව කරුණු සොයා ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මණ්ඩලය සහ ලූල්කඳුර වතුයායට ඉන්ධන ගබඩා කිරීමේ ටැංකියක් මිලදී ගැනීම සඳහා 2022 සැප්තැම්බර් 28 දින රු.1,613,000 ක අත්තිකාරමක් ලබා දී තිබුණද 2025 ජූලි 22 දින වන විටත් ඉන්ධන ටැංකිය මිලදී ගෙන ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ටැංකිය සම්බන්ධව ගෙවීම් පිළිගනු ලබන අතර 2025 වසරේ මේ පිළිබඳව විස්තර සොයා බලා ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ඉන්ධන ටැංකිය සවි කිරීමට කටයුතු කර නොමැති නිසා එම ගෙවා තිබූ අත්තිකාරම් නැවත අය කර ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත අනුව විකල්ප ඉඩම් ලබා දීම සඳහා ප්‍රතිපාදන නොමැති වුවත් 2019 ජූලි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් මත පදනම්ව පෙන්රින් වත්තේ අක්කර 22 රූඩ් 00 පර්චස් 30.08 ක ප්‍රමාණයට විකල්ප ඉඩම් වශයෙන් පුද්ගලයින් දෙදෙනෙකුට හන්තාන උඩුවෙල වතුයායෙන් ඉඩම් ලබා දී තිබුණි. එම අනුමැතිය මත පදනම්ව 2020 ජූලි 31 දින මෙම ඉඩමේ අයිතිය රු.101,109 ක් වැනි අඩු වටිනාකමකට අදාල පුද්ගලයින් දෙදෙනා වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පවරා තිබුණි. තවද විකුණුම් ගිවිසුම් අංක 5792 මඟින් මෙම ඉඩමේ හිමිකරුවන් විසින් 2020 දෙසැම්බර් 11 වන දින අදාල ඉඩම දේපල විකුණුම් සමාගමකට (Land sale) රු.159,753,600 කට විකුණා තිබුණු අතර පසුව එය හෝටලයක් සඳහා පුද්ගලික සමාගමකට 2025 ජූලි 22 වන විටත් විකුණා තිබුණි. | සඳසිරි ලක්ෂ්මන් වීරරත්න සහ ඉන්දුක තිස්ස වීරරත්න යන අය වෙත කොළඹ දිස්ත්‍රික්කයේ පෙන්රිත් වතුයාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දුන් අක්කර 22 පර්චස් 30.02 ක ඉඩම් ප්‍රමාණය නිදහස් කිරීමට පුස්සැල්ලාව වැවිලි සමාගම කටයුතු නොකිරීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඊට විකල්පයක් ලෙස උඩුවෙල වතුයායෙන් අක්කර 22 පර්චස් 30.08 ක් ලබාදෙන ලෙස ඉල්ලුම් කරන ලදී. ඒ අනුව එම ඉල්ලීම ජනතා වතු සංවර්ධන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව එම ඉල්ලීමට මෙම ඉඩම් කොටස ලබා දීම සඳහා අනුමැතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. මෙම ඉඩමේ වටිනාකම සම්බන්ධයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය කිසිදු තීරණයක් ගෙන නොමැති බවත් ඒ සඳහා මැදිහත් වීමක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට කළ නොහැකි බවත් දන්වා සිටින අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් පුද්ගලයින් වෙත ලබා දී ඇති ඔප්පුව මත පසුව මෙම ඉඩම සඳහා විකුණුම්කර ලියා ඇති බවත් සඳහන් කරනු ඇත. | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා මණ්ඩලයට පැවරී ඇති ඉඩම් වලින් විකල්ප ඉඩම් ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දීම හා ඒ සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව විසින් ඔප්පු ලබාදීම පිළිබඳව විමර්ශණයක් සිදු කළ යුතුය. |
| (ඉ) | 2007 නොවැම්බර් මස සිට නාගස්තැන්න වතු යාය පෞද්ගලික සමාගමකට බදු දීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද ගිවිසුම් ගත වී වසරක් ගතවීමට පෙර වතු යායේ ගස් 120ක් එම සමාගම විසින් අනවසරෙන් කපා | 2007 වර්ෂයේදී නාගස්තැන්න වතුයායේ පාලනය ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ක්වින්රිච් ඇග්රෝ පුද්ගලික සමාගම සමඟ එක්ව පිහිටුවන ලද සිලෝන් යුනයිටඩ් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති | මණ්ඩලයට සිදු වී තිබූ අලාභය තක්සේරු කර බදු කරුගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉවත් කිරීම හේතුවෙන් එම වතුයාය නැවත මණ්ඩලයට පවරාගෙන තිබුණි. එම ගස්වල අලාභ අයකර ගැනීමට 2008 මැයි මාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවරා තිබුණි. එම අලාභය තක්සේරු කර අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතර නඩු කටයුත්තද දෙපාර්ශවයේ එකඟතාවයෙන් කිසිඳු වන්දියක් ලබා ගැනීමෙන් තොරව 2009 දෙසැම්බර් 28 දින අවසන් කර තිබුණි. | අතර, ක්වින්රිච් ඇග්රෝ පුද්ගලික සමාගම විසින් රු.මිලියන 30 ක් ආයෝජනය කරන ලදී. එම මුදල ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවීම් කළ අතර, එමගින් නාගස්තැන්න වතුයායේ හිඟ වාවස්ථාපිත ගෙවීම් කරන ලදී.<br>ඉන් අනතුරුව වතුයායේ පාලනය සිලෝන් යුනයිටඩ් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් සිදු කළ අතර, එහිදී නාගස්තැන්න වතුයායේ පැවති වාණිජ වටිනාකමක් සහිත ගස් 120 ක් හෙලීම් කර තිබුණි. ඒ අනුව රු.11,200,000/- ක මුදලක අලාභයක් වතුයායට සිදු වී ඇති බව එවකට වැවිලි කළමණාකරු විසින් ප්‍රකාශයක් ලබා දී තිබුණද ගස්වල වටිනාකම රු.7,529,688 ක වටිනාකමක් මත එම ගස් හෙලීමට එරෙහිව පනවා තිබූ අංක B 2683/08 දරණ නඩුව සමථ වී ඇත. එම වටිනාකම දිස්ත්‍රික් වන නිළධාරිතුමාගෙන් 2008.08.12 දින ලබාගෙන ඇති බව සඳහන් කර ඇතිමුත් එහි පිටපතක් අප සතුව නොමැත. එහි පිටපතක් ලබා ගැනීම සඳහා පියවර ගන්නා බව වැඩිදුරටත් දන්වනු ඇත. | |
| (ඊ) | නාගස්තැන්න සහ කන්දල්ඔය වතුයායන් වල පිළිවෙලින් රු.1,539,546 ක් හා රු.1,256,046 ක මුදල් සොරා ගැනීම් සිදු වී වසර 11ක් පමණ ගතවී තිබුණද, පවරා තිබූ නඩු කටයුත්තෙහි වර්තමාන තත්ත්වය සොයා බලා නොතිබූ අතර වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නඩු අංක HC 223/20 යටතේ නුවර මහාධිකාරණයේ මෙම නඩුව තවමත් විභාග වෙමින් පවතී. 2025.12.11 දින නැවත කැඳවීමට කටයුතු කර ඇත. තවමත් නඩු කටයුතු පවතින බැවින් අලාභය අයකර ගැනිමට නොහැකිව ඇති අතර, ඉදිරි නීතිමය පියවර අනුව කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ ශේෂය තුළ ඇතුළත් මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති විශේෂ ව්‍යාපෘති හා වතුර බෝතල් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු රු.753,449 ක වියදම් අනාර්ථික වියදම් බවට පත්වී තිබුණි. | මෙම වතුර බෝතල් ව්‍යාපෘතිවලට දැරූ වියදම් අනාර්ථික වියදම් බවට පත්වී ඇති බව සත්‍යකි. මෙම ව්‍යාපෘති දැනට නොපවතින බව වතු අධිකාරීන් විසින් තහවුරු කර ඇත. | සැලසුමකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වොක්ෂෝල් වීදියේ පිහිටි මණ්ඩලය සතු ගබඩා 2ක් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව 2005 වර්ෂයේදී වසර 30ක් සඳහා රු.105,000 ක මාසික බදු කුලියකට පෞද්ගලික සමාගමක් වෙත බදු දීමට ගිවිසුම් ගත වී තිබුණි. එම බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තක්සේරු වාර්තාව පදනම් කරගෙන මාසික බදුකුලිය ගෙවීමට එකඟ වී තිබුණි. මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.95,000 බැගින් මාසික වාරික 49 ක් වෙනුවෙන් රු.4,655,000 ක් හා රු.175,000 බැගින් මාසික වාරික 14 ක් වෙනුවෙන් රු.2,450,000 ක් බදු දුන් 2005 දෙසැම්බර් සිට 2011 පෙබරවාරි දක්වා බදු කුලියේ වැඩි වීම වූ එකතු වටිනාකම රු.7,105,000 ක මුදලක් අය කර නොතිබුණි.<br>පළමු බදු ගිවිසුම අවසන් වීමට පෙර නැවත එම බදුකරු සමඟ 2011 මාර්තු මාසයේදී එම රු.105,000 ක මාසික බදු කුළී වටිනාකමකට ගෙවීමටත් තක්සේරු වාර්තා පදනම් කරගෙන මාසික බදු කුලිය ගෙවීම යන වගන්තිය ඉවත් කර වසර 30කට බදු දීමට ගිවිසුමකට එළඹී තිබුණි.<br>දෙවන බදු ගිවිසුම අනුව තක්සේරු වාර්තාව පදනම්ව බදු අයකිරීම් කොන්දේසි ඉවත් කිරීම නිසා 2011 මාර්තු සිට මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.119,000 බැගින් මාසික වාරික 58 ක් වෙනුවෙන් රු.6,902,000 ක් සහ රු.353,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.12,708,000 වශයෙන් හා රු.438,000 බැගින් මාසික වාරික 48 ක් වෙනුවෙන් රු.21,024,000 ක් වශයෙන් එකතුව රු.40,634,000 ක් 2011 මාර්තු සිට 2022 දෙසැම්බර් දක්වා තක්සේරු වාර්තාවට අනුව අයවිය යුතු බදු ආදායමක් මණ්ඩලයට අහිමිවී තිබුණි. | වොක්ෂෝල් වීදිය පිහිටි ගබඩා දෙකක් නිලෝනා ලංකා පුද්ගලික සමාගම වෙත බදු පදනම මත ලබා දී තිබූ අතර, එම ගොඩනැඟිලි බදු පදනම මත ලබා දීම සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීම සම්බන්ධයෙන් තොරතුරු ලිපිගොණුව තුළ නොමැත. එම කාර්ය හා සම්බන්ධව කටයුතු කරන ලද සේවකයින්ද දැනට සේවයේ නොමැති හෙයින් ඒ පිළිබඳව සොයා බැලීමටද හැකියාවක් නොමැත. කෙසේ වෙතත් ඔබ විසින් පෙන්වා දී ඇති 2005 සිට 2011 දක්වා කාලය සඳහා හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත.<br>2011 වසරේදී අත්සන් කරන ලද බදු ගිවිසුම අනුව තක්සේරුව මත බදු මුදල් සංශෝධනය කිරීමට නොහැකි වීම මත මෙම අලාභය මණ්ඩලයට සිදු වී ඇති බව පිළිගන්නා අතර, නව ගිවිසුමක් අත්සන් කිරීම සඳහා සාකච්ඡා කළද ඉලේපෙරුම පාර්ශවය සමඟ පැවති නඩුව සඳහා ලබා දී ඇති නඩු තීන්දුව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩම තුළ මහල් ගොඩනැඟිලි තැනීමට අවසර නොදීම ඊට බාධාවක් වී ඇත. | ගිවිසුම් ප්‍රකාරව තක්සේරු වාර්තාවට අනුව අය විය යුතු හිඟ මුදල් අය කර ගැනීමට හා ගිවිසුම් වගන්ති සංශෝධනය කර නව බදු ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |